

# නීතිමඤ්ජරී

ධම්මවිචය

# නීතිමඤ්ජරී

*"ධම්මා සුතා ධාතා වචසා පරිචිතා මනසානුපෙක්ඛිතා දිට්ඨියා සුප්පටිවිද්ධා."*

(මහා සුඤ්ඤත සුත්තං; මජ්ඣිම නිකායො, උපරිපණ්ණාසකො, සුඤ්ඤත වග්ගො.)

පටුන සංස්කරණය - භික්ඛු ධම්මවිහාරි

*(ඡට්ඨ සංගායනා ත්‍රිපිටක වැඩසටහනින් උපුටා සකසන ලදී)*

නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස

# නීතිමඤ්ජරී

**1.**

කුලක්ඛයෙ විනස්සන්ති,
කුලධම්මා සනන්තනා;
ධම්මෙ නට්ඨෙ කුලං සබ්බං,
අධම්මො අභිභූ බලං.

**2.**

අධම්මාභිභවා දන්තා,
පදුස්සන්ති කුලිත්ථියො;
ථීසු දුට්ඨා ස්ව ධම්මෙන,
ජායතෙ වණ්ණසඞ්කරො.

**3.**

පියං භාසෙ ගුණග්ගාහො,
සූරො සියා විකන්තනො;
දාතා චන්දසමා නාරී,
දිට්ඨං දිට්ඨං නභාසයෙ.

**4.**

කුතොත්ථී කුමිත්තෙ සච්චං,
කුදාරෙ රතිවඩ්ඪනං;
කුදෙසම්හි මනො රම්මං,
කුරාජෙ භොගසම්පදං.

සඞ්කෙතෙව අමිත්තස්මිං,
මිත්තස්මිං පි නවිස්සසෙ;
අභයා භය මුප්පන්නං,
අපි මූලානි කන්තති.

අදිට්ඨොව පරො සෙය්‍යො,
දුම්මිත්තො නො විස්සාසිකො.

අග්ගිහොමඵලං වෙදො,
සත්ථංසීලඵලං මතං;
රතිපුත්තඵලං නාරී,
දානභුත්තිඵලං ධනං.

අසච්චං සාහසං මායා,
මූළ්හත්ත ම තිලොහතා;
අසොචං නිද්දයත්තඤ්ච,
ථීනං දොසා සභාවජා.

ජායාය හත්තුනො භාරො,
සිස්සෙන ගුරුනො කතො;
අමච්චකෙහි රාජස්ස,
පිතරානං නිජෙනච.

**5.**

උය්‍යාමෙන හි සිජ්ඣන්ති,
කම්මානි න මනොරථා;
න හි සුත්තස්ස සීහස්ස,
පවිසන්ති මුඛෙ මිගා.

අතිසීතං අතිඋණ්හං,
අතිසායමිදං අහු;
ඉති විසට්ඨකම්මන්තෙ,
ඛණා අච්චෙන්ති මාණවෙ.

ආදානස්ස පදානස්ස,
කත්තබ්බස්ස ච කම්මුනො;
ඛිප්පං අකය්‍යමානස්ස,
කාලෙ පිවති සම්පදං.

නාදබ්බෙ නිහිතා කාචි,
ක්‍රියා ඵලවතී භවෙ;
නබ්‍යාපාරසතෙනාපි,
සුකොව පාඨතෙ බකො.

යො දන්ධකාලෙ තරති,
තරණීයෙ ච දන්ධයෙ;
සුක්ඛපණ්ණං ච අක්කම්ම,
අත්ථං භඤ්ජති අත්තනො.

**6.**

යං දදාති යං භුඤ්ජති,
තදෙව ධනිනො ධනං;
අඤ්ඤෙ මතස්ස කීළන්ති,
දාරෙහිපි ධනෙහිපි.

දානොපභොගහීනෙන ,
ධනෙන ධනිනො සුඛං;
කො විසෙසො දලිද්දස්ස,
අධිකං ධනරක්ඛණං.

නිජසොඛ්‍යං නිරුන්ධන්තො,
නීචභොගො මිතම්පචො;
ධනං සඤ්චයතෙ යො සො,
පරභාරවහො පසු.

යං උස්සුකා සඞ්ඛරොන්ති,
අලක්ඛිකා බහුං ධනං;
සිප්පවන්තො අසිප්පාවා,
ලක්ඛි වා තානි භුඤ්ජති.

**7.**

සම්පත්‍යං මහතං චිත්තං,
භවෙ උප්පලෙ කොමලං;
විපත්‍යංච මහාසෙල,
සිලාසඞ්ඝාතකක්කසං.

**8.**

අසම්භබ්‍යගුණං ඵුත්වා,
ඛෙදො මුධාව ජායතෙ;
අව්හායං චන්ද මු ල්ලොක්‍ය,
නචන්දොත මු පාගමී.

**9.**

සච්චං මුඛම්හි ධාරෙයාා,
කණ්ණෙ සුතං භුජෙ ජයං;
හදයම්හි ඛමං වීරං,
ලොකාදාසංච ලොචනෙ.

සද්දමත්තං නඵන්දෙයාා,
අඤ්ඤත්වා සද්දකාරණං;
සද්දහෙතුං පරිඤ්ඤාය,
පමොදො වා භයො තථා.

සබ්බසුත ම ධීයෙයාා,
හීනමුක්කට්ඨමජ්ඣිමං.

**10.**

දුන්නාරියා කුලං සුද්ධං,
පුත්තො නස්සති ලාලනා;
සමිද්ධි අනයා බන්ධු,
පවාසා මදනා හිරී.

ලාලයෙ පඤ්චවස්සානි,
දසවස්සානි තාලයෙ;
පත්තෙතු සොළසෙවස්සෙ,
පුත්තං මිත්තංව ආචරෙ.

ලාලනෙ බහවො දොසා,
ලාලනෙ බහවො ගුණා.

පාපා නිවාරයති යොජයතෙ හිතාය,
ගුය්හානි ගූහති ගුණං පකටීකරොති;
ආපත්තිකඤ්ච නජහාති දදාති කාලෙ,
සම්මිත්ත ලක්ඛණමිදං පවදන්ති සන්තො.

**11.**

දුජ්ජනො ජීයතෙ යුත්‍යා,
නිග්ගහෙන නයීමතා;
නිපාත්‍යතෙ මහාරුක්ඛො,
තස්සමීප ඛතික්ඛයා.

වනෙ මිගාච ලුද්ධානං,
දුජ්ජනානඤ්ච සජ්ජනා;
අකාරණවෙරී හොන්ති,
තිණභක්ඛා සුපෙසලා.

පාදලග්ගං කරට්ඨෙන,
කණ්ඩකෙනෙව කණ්ඩකං.

බාලං නපස්සෙ නසුණෙ,
නචබාලෙන සංවසෙ;
බාලෙනාල්ලාපසල්ලාපං,
නකරෙ නචරොචයෙ.

**12.**

උප කත්තුං යථා බුද්දො,
සමත්ථො නතථාමහා;
කූපො හි හන්ති පිපාසං,
නතු පායො මහම්බුධි.

**13.**

ආදානස්ස පදානස්ස,
කත්තබ්බස්සච කම්මුනො;
ඛිප්පං අකරමානස්ස,
කාලො භක්ඛති තං රසං.

නක්ඛත්තං පටිමානෙන්තං,
අත්ථො බාලං උපජ්ඣගා;
අත්ථො අත්ථස්ස නක්ඛත්තං,
කිං කරිස්සන්ති තාරකා.

අජරාමරොව පඤ්ඤො,
විජ්ජමත්ථඤ්ච චින්තයෙ;
ගහිතොවිය කෙසෙසු,
මච්චුනා ධම්මමාචරෙ.

**14.**

වජ්ජා ගුරුච මන්තීච,
තයො රට්ඨාභිසඞ්ඛතා;
ජීවීත දක්ඛ කොසානං,
වඩ්ඪනා නාසනාච තෙ.

**15.**

පීරෙන කම්මං වඩ්ඪති,
අපීරෙන තුරෙන නො;
ඵලන්ති සමයෙ රුක්ඛා,
සිත්තාපි බහුවාරිනා.

වායාමෙථෙව පුරිසො,
නනිබ්බින්දෙය්‍ය පණ්ඩිතො.

පයතනො තාදිසො නෙව,
කයෙය්‍යා යෙන ඵලං නහි;
සෙලග්ගෙ කූපඛණනා,
කථං තොයසමාගමො.

ඤාණඞ්කුසෙන සම්මග්ගං,
නියාතුස්සාහකුඤ්ජරො.

අසමෙක්ඛිතකම්මන්තං,
තුරිතාභි නිපාතිනං;
තානිකම්මානි තප්පෙන්ති,
උණ්හං ව ජ්ඣොහිතං මුඛෙ.

**16.**

ඡද්දොසා පුරිසෙනෙහ,
හාතබ්බා හූතිමිච්ඡන්තා;
නිද්දා මජ්ජං හයං කොධො,
ආලස්‍යං දීඝසුත්තතා.

න දිවා සුප්පසීලෙන,
රත්තිමුට්ඨානදෙස්සිනා;
නිච්චසොණ්ඩෙන මත්තෙන,
සක්කා ආවසිතුං ඝරං.

අහෙතබ්බම්හි හායන්ති,
හායිතබ්බෙ නහායරෙ;
හයාභය විමුළ්හා තෙ,
ජිම්හානුගා උජුඤ්ජහා.

යස්ස මනුස්සභූතස්ස,
නත්ථි භොගාච සිප්පකං;
කිං ඵලං තස්ස මානුස්සං,
ද්විපාදට්ඨයො හි සො මිගො.

**17.**

නානොපායොච කත්තබ්බො,
සචෙ භවෙය්‍ය අත්තනො;
අත්ථසිද්ධි යථාකාමං,
උපායො හි හිතඤ්ජසො.

ලඤ්ජදානබාලිසෙන ,
කූටඩ්ඩකාරධීවරා;
විනිච්ඡයමහාමච්ඡං,
ඔට්ටෙන්ති ලොභසාගරෙ.

යස්සෙතෙ චතුරො ධම්මා,
වානරින්ද යථාතව;
සච්චං ධම්මො ධිති චාගො,
දිට්ඨං සො අතිවත්තති.

**18.**

විද්වාච රතනං නාරී,
වීණා සාත්ථං ගිරංමහී;
ගුණවිසෙස මාගම්ම,
ගුණානි අගුණානිච.

ධනවා බලවා ලොකෙ,
ධනා භවති පණ්ඩිතො.

සුමනෙ නිස්සිතො කීටො,
නිග්ගුණො හීනකො සයං;
තං පුප්ඵෙහි මණ්ඩෙන්තානං,
රඤ්ඤං සිරොපි රොහති.

අලක්ඛිකෙහි සඤ්චිතා,
ධනභොගාව චින්තිතා;
ලක්ඛිකස්ස භවන්තෙතෙ,
ලක්ඛිවා සුථ්යුභුඤ්ජති.

ඛත්තියො සෙට්ඨො ජනෙ තස්මිං,
යො ගොත්තපටිසාරිනො;
විජ්ජාචරණසම්පන්නො,
සො සෙට්ඨො දෙවමානුසෙ.

විසාපි අමතං ගණ්හෙ,
ගූථතො මණිමුත්තමං;
කණ්ටකපාදපා පුප්ඵං,
ථීරතං දුක්කුලා වරං.

ධනිස්සරාදිගුණොම්මි -
වෙගෙන වාහිතා පජා.

**19.**

යස්ස ත්ථී සතතං මෙත්තා,
සබ්බලොකසුවල්ලභා;
කූපායතෙ සමුද්දොපි,
අග්ගි තස්ස ජලායතෙ.

**20.**

සක්ඛරායති මෙරූපි,
විසභක්ඛො සුධායතෙ;
සසායතෙ මිගරාජ,
බ්‍යාලො මාලාගුණායතෙ;
දොලායතෙ ඡමාචාලො,
නානාවුධා තිණායරෙ.

**21.**

සමෙව සති උස්සාහෙ,
සුඛවාහො හිතඞ්කරො;
ඌනෙ-ධිකෙ තථා නොහි,
මජ්ඣගො සාධු සබ්බදා.

සාධු ඛො පණ්ඩිතොනාම,
නත්වෙව අතිපණ්ඩිතො.